# අර්ධ නාගරික ආර්ථිකය ඉහළ නැංවීම උදෙසා ගෙවතු වගාවේ දායකත්වය පිළිබඳ අධ්‍යයනය. (අත්තනගල්ල ප්‍රදේශය ඇසුරින්)

එච්. කේ. ඒකනායක[1]

**සංක්ෂේපය**

ස්වයංපෝෂිත ආර්ථික රටාවකට හුරුව තිබූ මෙරට ජනයා යටත්විජිත පාලන ක්‍රමයෙන් පසු නාගරික මධ්‍යම පාන්තික ජීවන රටාවකට හුරු විය. එහෙත් තවමත් අර්ධ නාගරික ජන ජීවිතය තුළ ද කෘෂිකර්මය ශේෂව පවතී. ඔවුහු තම දායාදයෙන් ලැබෙන කෘෂිකර්ම ජීවන රටාව තුළින් තම ආර්ථික රටාව පුළුල් කර ගැනීමට උත්සාහ දරති. වර්තමානය වනවිට ග්‍රාමීය ආර්ථිකය දිරි ගැන්වීම උදෙසා ගැමි දිරිය, සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක වුවත් පවතින ආර්ථික රටාව හමුවේ එය එතරම් ප්‍රමාණවත් වේ යැයි සැලකිය නොහැක. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ, අර්ධ නාගරික ආර්ථිකය ඉහළ නැංවීම උදෙසා ගෙවතු වගාවේ ඇතිවන දායකත්වය, ඇතිවන ආර්ථික බලපෑම අධ්‍යයනය කිරීමයි. මේ සඳහා යොදාගනු ලැබුවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 347/B කෝළවත්ත ග්‍රාමසේවා වසමේ තෝරාගත් පවුල් 100කි. මෙහිදී මෙම ග්‍රාමසේවා වසමේ 78% ක් විස්තෘත පවුල් වන අතර 22% ක් න්‍යෂ්ටික පවුල් විය. ඒ අතර ම පවුල් 68 ක් ස්ත්‍රී හා පුරුෂ දෙදෙනා ම රැකියාවක නිරතවේ. ගෘහණියන් එදිනෙදා ජීවිතයේ ගෙවතු වගාවේ නිරතව ඇත. තවද විනෝදාංශයක් ලෙස ද භූමිය පරිභෝජනය කිරීමේ අරමුණින් සුලු වශයෙන් නිරත වේ. ගෘහණියන් ආර්ථික ප්‍රතිලාභ උදෙසා පමණක් ම නොව නැවුම් ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමේ අරමුණින් ගෙවතු වගාවේ නිරත වේ. පවුලේ පරිභෝජනයෙන් පසු අතිරික්තයක් ඇත්නම් ඒවා විකිණීමට පෙළඹේ. එහෙත් අඩු ආදායම්ලාභී පවුල් සිය ආර්ථික මට්ටම ඉහළ නංවා ගැනීම උදෙසා ම ගෙවතු වගාවෙහි නිරතව ඒවා විකුණා ආදායම උපයා ගන්නා බව අනාවරණය විය. මෙහි දී මොවුහු මුහුණපාන ගැටලු ලෙස තවමත් සාම්ප්‍රදායික ක්‍රම යටතේ වගාවේ නිරත වීම, නව ක්‍රම පිළිබඳ අවබෝධයක් නොතිබීම, මොවුන්හට දිගුකාලීන වෙළඳපළක් නොතිබීම යනාදිය දැක්විය හැක.

**මුඛ්‍ය පද :** අර්ධ නාගරික ආර්ථිකය, ගෙවතු වගාව, කෘෂිකර්මය, අඩු ආදායම්ලාභී

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, 93816@gmail.com